ශීර්ෂය 224 - ශ්‍රී ලංකා ගුවන් හමුදාව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 224 - ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් **1**හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන්

ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ඒසීඒ 6) වර්ෂ අවසානයේ ඉඩම් වල මුළු වටිනාකම රු. බිලියන 32.68 ක් ලෙස දක්වා තිබුණු අතර, විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව ඉඩම්වල වටිනාකම රු. බිලියන 31.18 ක් වූයෙන් එම වටිනාකම් අතර රු.බිලියන 1.5 ක වෙනසක් පැවතුණි.	කඳවුරු වෙතින් ලබා දී ඇති තක්සේරු වාර්තාවන් පදනම් කර ගනිමින් ගණනය කිරීම නිසා සිදු වූ දෝෂයක් බව.	රු.බිලියන 1.5 ක වෙනසට හේතු හඳුනා ගෙන නිවැරදි කළ යුතු වීම.
(ii)	සමාලෝචිත වර්ෂය අවසන් වන විට ගුවන් හමුදාව විසින් එකතුව රු. මිලියන 53.91 ක් වටිනා බාහිරින් මිලදී ගන්නා පරිගණක මෘදුකාංග 43 ක් භාවිතා කරමින් පවතින අතර, මෙම වත්කම් මූල්‍ය ප්‍රකාශන තුළ අනාවරණය කර නොතිබුණි. තවද ගුවන් හමුදාව විසින් 2009 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අභ්‍යන්තරිකව සකස් කර ඇති පරිගණක මෘදුකාංග 159 ක පිරිවැය ගණනය කර ,මූල්‍ය ප්‍රකාශන තුල අනාවරණය කර නොතිබුණි.	මිලදී ගන්නා ලද පරිගණක මෘදුකාංග පිරිවැය මතත්, තොරතුරු තාක්ෂණ අංශය විසින් සකස් කළ මෘදුකාංගවල තක්සේරු වටිනාකමත් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශ මගින් ඉදිරියේදී අනාවරණය කිරීමට කටයුතු කරන බව.	අදාළ අස්පෘශ්‍ය වත්කම් වල වටිනාකම් මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය කළ යුතු වීම.
(iii)	2022,2023 හා 2024 වර්ෂවල කෙරීගෙන යන වැඩ වටිනාකම් අඛණ්ඩව එකතු කර එක් එක් වර්ෂයේ අවසාන ශේෂය ලෙස මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශ වල ඇතුළත් කර තිබුණු නමුත් ,එක් එක් වර්ෂයේ නිම කරන ලද වැඩ කොටස් වල පිරිවැය නිමි වැඩ ලෙස ප්‍රාග්ධනිත කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට කටුකුරුන්ද ගුවන් හමුදා කඳවුරේ පමණක් නිම කරන ලද වැඩ වල වටිනාකම රු.මිලියන 108.98 ක් බව විගණනයට වාර්ථා කර තිබුණු අතර මෙම වටිනාකමද සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධනිත කර නොතිබුණි.ප්‍රාග්ධනිත නොකළ සෙසු වටිනාකම විගණනයට අනාවරණය කර නොතිබුණි.	පෙන්වා දී ඇති පරිදි එම වර්ෂයන්හි නිම කරන ලද වැඩ කොටස්වලට නිමි පිරිවැයන් වෙන් වෙන් වශයෙන් මූල්‍ය නොවන වත්කම් ලෙස ඉදිරිපත් කිරීමට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගෙන ඇති බව.	කෙරීගන යන වැඩ වලින් එක් එක් වර්ෂයේ නිම වූ ප්‍රමාණයන් නිවැරදිව ප්‍රාග්ධනිත කළ යුතු වීම.

(iv)	එකතුව වර්ග අඩි 93,206 ක් වූ ගොඩනැගිලි 60 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම තක්සේරු කර නොතිබූ බැවින් මෙම ගොඩනැගිලි වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව නොතිබුණි.	කඳවුරු ගොඩනැගිලි වල වටිනාකම්හි වෙනසක් ඇති අතර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබා ගෙන අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කරන බව.	අදාළ ගොඩනැගිලි තක්සේරු කර ගිණුම් ගත කළ යුතු වීම.
(v)	ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානය ස්ථාපිත කර ඇති ඉඩම හා ගොඩනැගිල්ල ගිණුම් ගත කර නොතිබුණු අතර, මේ නිසා එම වටිනාකමින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ශුද්ධ වත්කම් ඌණ ගණනය වී තිබුණි.	මෙම ඉඩම නීත්‍යානුකූලව අත්පත් කර ගැනීම/ පවරා ගැනීම් කටයුතු සිදු කරමින් පවතින අතර එම කටයුතු අවසන් වීමෙන් පසු ලේඛනගත කරනු ලබන බව.	මූලස්ථාන ඉඩම හා ගොඩනැගිල්ල කඩිනමින් පවරාගෙන ගිණුම්ගත කල යුතු වීම.
(vi)	සමාලෝචිත වර්ෂය අවසානයට ගුවන් හමුදාවේ පැවති යුධ උපකරණ මූල්‍ය ප්‍රකාශන වල මූල්‍ය නොවන වත්කම් ලෙස ඇතුළත් කර නොමැති අතර, මේ නිසා එම වත්කම් වල වටිනාකමින් ශුද්ධ වත්කම් ද ඌණ ගණනය වී තිබුණි.	ජාතික ආරක්ෂාව පිළිබඳ සංවේදී තොරතුරු හේතුවෙන් මූල්‍ය ප්‍රකාශ වල හෙළිදරව් කර නොමැති අතර ඒ සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් ලද වහාම ඒ අනුව කටයුතු කරන බව.	ආයතනයට අයිත් ස්ථාවර වත්කම් වල වටිනාකම් ගිණුම් ගත කළ යුතු වීම.
(vii)	මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ සමාලෝචිත වර්ෂ අවසානයට යතුරු පැදි ඇතුළු වාහන වල වටිනාකම රු.මිලියන 5,622.66 ක් ලෙස දක්වා ඇති අතර, විගණනයට ලබා දී ඇති තොරතුරු අනුව වර්ෂ අවසානයට වාහන වල තක්සේරු වටිනාකම රු.මිලියන 5,986.96 ක් වූයෙන් එම වටිනාකම් අතර රු.මිලියන 364.30 ක වෙනසක් පැවතුණි.	මතුවී ඇති පරස්පරතාවය මගහරවා ගනිමින් නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ඉදිරියේදී සිදු කරනු ලබන බව.	වත්කම් සම්බන්ධ නිවැරදි වටිනාකම් ගිණුම් ගත කළ යුතු වීම.
(viii)	සමාලෝචිත වර්ෂය අවසානයට ගුවන් හමුදාවට අයත් තක්සේරු කර තිබුණු ගොඩනැගිලි වටිනාකම රු.මිලියන 10,715.37 ක් ලෙස විගණනයට කරුණු වාර්තා කර ඇති අතර, මූල්‍ය ප්‍රකාශය සමඟ ඉදිරිපත් කරන ලද මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ (ඒසීඒ 6) සමාලෝචිත වර්ෂය අවසානයට ගොඩනැගිලි වටිනාකම රු.මිලියන 15,252.81 ක් ලෙස දක්වා තිබීමෙන් රු.මිලියන 4,537.44 ක වෙනසක් පැවතුණි.	කඳවුරු විසින් ලබා දී ඇති තොරතුරු වල යම් විෂමතාවයක් ඇති බැවින් ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව.	වෙනස්කම් හඳුනාගෙන නිවැරදි වටිනාකම් ගිණුම් ගත කළ යුතු වීම.

(ix)	සමාලෝචිත වර්ෂයේ කෙරීගෙන යන වැඩ වලට අදාළ මිලදී ගැනීම් ලෙස රු.මිලියන 298.99 ක් දක්වා තිබුණද විගණනයට ලද තොරතුරු අනුව මෙම වටිනාකම රු. මිලියන 0.52 ක් වූයෙන්, රු.මිලියන 298.47 ක වෙනසක් පැවතුණි.	නිමි පිරිවැයන් වෙන් වෙන් වශයෙන් මූල්‍ය නොවන වත්කම් ලෙස ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට නියමිත බව.	සහතික කරන ලද වර්ෂ අවසාන නොනිමි වැඩ වල පිරිවැය මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතු වීම.

(ආ) විගණන සාක්ෂි නොවීම

පහත සඳහන් ගනුදෙනුව සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
ගුවන් හමුදා නිලධාරීන් 579 දෙනෙකුගෙන් වර්ෂ 01 ත් 20 ත් අතර කාලයට අදාලව හිඟ ණය ශේෂ අය කිරීමේදී එකතු වටිනාකම රු.මිලියන 2.14 ක් වූ වැඩියෙන් අය කිරීම් නැවත පියවීම් ලෙස අත්තිකාරම් බී ගිණුම හර කර තිබූ නමුත් එම පියවීම් තත්‍ය වශයෙන්ම පියවා ඇති බවට සනාථ කිරීමට අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.	මෙම වැඩිපුර අය වූ ණය ශේෂයන් රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2024 අනුව මු.රෙ 113 ගිණුම්කරණ දෝෂ නිවැරදි කර ගැනීම් යටතේ පොත්වලින් අතහැර දැමීම සඳහා කෙටුම්පත් සකස් කළද කපා හැරීම සඳහා අදාළ කමිටුව විසින් සැලකිල්ලට නොගැනීම නිසා ගිණුමේ ඉදිරියට ගෙන ඒමට සිදු වූ බව.	ණය ශේෂ අයවීම් හා ගිණුම් තැබීම නිවරදිව සිදුවිය යුතුවීම.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මුල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

	ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
(i)	2.5	2017 අංක 24 දරණ නව දේශීය ආදායම් පනතට අදාළව අත්තාකාරම් පුද්ගල ආදායම් බදු (APIT) ගණනය කළ යුතු වීම.	-
(ii)	2.1 (ආ)	වර්ෂ 5 ත් වර්ෂ 20 ත් අතර කාල ප්‍රමාදයකින් යුතුව හිඟ හිටව පවතින එකතුව රු.මිලියන 12.67 ක හිඟ ගුවන් ගමන් ආදායම් අය කර ගත යුතු වීම.	3.1 (අ)
(iii)	3.5	අයවිය යුතු එකතුව රු.420,454 ක ගුවන් යානා අංගන සහ ගොඩනැගිලි කුලී ආදායම කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම.	3.1 (ආ)

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය අවසානය වන විට වසර 06 ත් 21 ත් අතර කාලයක සිට පැවත එන හිඟ ගුවන් ගමන් ආදායම රු.මිලියන 12.67 ක් වූ අතර,එම හිඟ ආදායම තුළ 2004 සහ 2008 වර්ෂ වල පුද්ගලික ගුවන් සමාගම් දෙකකින් අයවීමට තිබුණු එකතුව රු.මිලියන 3.61 ක හිඟ ආදායමක් පැවතුණි.	ගුවන් හමුදා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී අඛණ්ඩව අවස්ථා 33 කදී සාකච්ඡා කර අවශ්‍ය නියෝග ලබා දීමත් ප්‍රගතිය විමර්ශනයත් සිදු කරන බව.	මෙම හිඟ ආදායම් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම.
(ආ)	2021 වර්ෂයේ විධිමත් ගිවිසුම් ගත වීමකින් තොරව ගුවන් හමුදා කටුකුරුන්ද කඳවුරේ ගුවන් යානා අංගනය සහ ගොඩනැගිලි පුද්ගලික ගුවන් සමාගමකට කුලියට දී තිබුණු අතර, ඒ වෙනුවෙන් ගුවන් හමුදාවට අයවිය යුතු එකතුව රු.420,454 ක ගුවන් යානා අංගන සහ	මුළු මුදල පොත්වලින් කපා හැරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කර ඇතත් මෙතෙක් ඒ සඳහා අනුමැතිය ලැබී නොමැති බව.	මෙම හිඟ ආදායම් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම.

	ගොඩනැගිලි කුලී ආදායම අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.		
(ඇ)	ගුවන් හමුදාව සතු ඩ්‍රෝන යානා යොදාගෙන 2024 වර්ෂයේ ජනවාරි 01 දින සිට 2024 අගෝස්තු 30 දින දක්වා ගාස්තු රහිතව සිදු කරන ලද ඩ්‍රෝන මෙහෙයුම් වෙනුවෙන් රු.567,165 ක ආදායමක් අහිමිවී තිබුණු අතර, ගාස්තු රහිතව අදාළ සේවා ලබා දීමට නිසි අවසරයක් ලබා ගෙන තිබුණේද යන්න විගණනයට අනාවරණය නොකෙරුණි.	ගුවන් හමුදාවේ ජනාධිපති මාධ්‍ය ඒකකයේ ,රූපවාහිනි සංස්ථාවේ, දළදා මාළිගයේ මාධ්‍ය ඒකකයේ වැනි ආයතන වල රාජකාරී සඳහා ගත වූ ඩ්‍රෝන ගාස්තු බව.	ගාස්තු රහිතව වෙනත් ආයතන වෙත සේවා ලබා දීමේදී නිසි අනුමැතියක් ලබා ගත යුතු වීම.

3.2 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ අංක 224-1-1-7-2509 දරණ වැය විෂයට හා අංක 224- 1-1-2-2509 Income Generated Commercial Projects වැය විෂයට පිළිවෙලින් සලසා තිබුණු රු.මිලියන 250 ක් හා රු.මිලියන 150 ක් වූ ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය අවසානයේදී ඉතිරි කර තිබුණි.	ශ්‍රී ලංකාව ණය නොගෙවන රටක් බවට ප්‍රකාශ කිරීමත් සමඟ මෙම ණය යෝජනා ක්‍රමය රඳවා ගැනීම මත විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙතින් ඒ සඳහා ගෙවීම් ගිණුම්ගත කිරීමට අනුමැතිය ලබා දී නොමැති හෙයින් සහ 2024 වර්ෂයෙහි MA-60 ගුවන්යානාවල මෙහෙයුම් කටයුතු සිදු නොවන බැවින් මෙම වැය විෂයන් වල ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව.	මෙහෙයුම් සිදු නොවන තත්වයක් තුල ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කළ යුතු වීම.
(ආ)	පුනරාවර්තන වැය විෂයන් 20 ක් සඳහා එකතුව රු.බිලියන 26.05 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු.බිලියන 4.51 ක ප්‍රතිපාදනද, මූලධන වැය විෂයන් 10 ක් සඳහා එකතුව රු.බිලියන 17 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු.බිලියන 5.19 ක ප්‍රතිපාදන ද උපයෝජනය නොකිරීම නිසා ඉතිරිකර තිබුණු අතර ,එම ඉතිරිකිරීම් ප්‍රමාණය වැය විෂයයන් සඳහා සළසා තිබූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 5.7 සිට සියයට 99.9 දක්වා පරාසයක පැවතුණි.	සකසුරුවම් ලෙස වියදම් කිරීම,අදාළ ප්‍රසම්පාදනයන් සම්පූර්ණ කර ගැනීමට නොහැකි වීම සහ අක් මුදල් කලට වේලාවට නොලැබීම වැනි හේතු නිසා මෙම ඉතිරිවීම් සිදු වී ඇති බව.	ඇස්තමේන්තු ගත ප්‍රතිපාදන කාර්යක්ෂම හා ඵලදායී ලෙස වැයකලයුතු වීම.
(ඇ)	224-1-1-0-1402 (තැපැල් හා සන්නිවේදනය) වැය විෂය සඳහා වෙනත් පුනරාවර්ථන වැය විෂයන්ගෙන් එකතුව රු.මිලියන 8.63 ක් මාරු කරගෙන තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසානයේ	අවසාන මාසයේ දුරකථන බිල්පත් ලබා ගැනීමට ප්‍රමාද වීම,බිල්පත් ගෙවීම් කිරීම සඳහා කාලය ප්‍රමාණවත් නොවීම, හිඟ සලාක දීමනා ලබා දීමේ ප්‍රමාණය	ඇස්තමේන්තු ගත ප්‍රතිපාදන කාර්යක්ෂම හා ඵලදායී ලෙස

මෙම මාරු කරගත් සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි. තවද පුනරාවර්තන වැය විෂයන් 05 ක් සඳහා එකතුව රු. මිලියන 513.63 ක් මාරු කරගෙන තිබුණු අතර, වර්ෂ අවසානයට එයින් එකතුව රු.මිලියන 103.82 ක් හෙවත් සියයට 20 ක් ඉතිරි කර තිබුණි.	අඩුවක් පෙන්නුම් කිරීම සහ අක්මුදල් නොමැති වීම වැනි හේතු නිසා ඉතිරිවීම් සිදු වී ඇති බව.	වැයකළයුතු වීම.

3.3 **බැරකම් හා බැඳීම්වලට එළඹීම**

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
විගණන නියැදි පරීක්ෂාවකදී හඳුනාගත් පරිදි සමාලෝචිත වර්ෂය අවසානයේ අවස්ථා 16 කදී ඇති කර ගත් එකතුව රු.මිලියන 71.90 ක් වූ බැරකම් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය (ඇමුණුම III) මඟින් හෙළිදරව් කර නොතිබුණි.	බිල්පත් **15** ක ප්‍රමාණය බැරකම් ලේඛණයට ඇතුළත් කර නොතිබීම ගුවන් හමුදාවේ අයවැය අංශය වෙතින් සිදු වූ අතපසුවීමක් බව.	බැරකම් නිවැරදිව හඳුනා ගෙන මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කළ යුතු වීම.

3.4 **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ගුවන් හමුදාව වෙත සමාලෝචිත වර්ෂයේ ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශය සහ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයෙන් එකතුව රු.බිලියන 2.08 ක ප්‍රතිපාදන විවිධ ව්‍යාපෘති සහ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ලබා දී තිබුණු අතර, වර්ෂය අවසානයේදී එයින් එකතුව රු. බිලියන 1.55 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. මෙම ඉතිරි කිරීම් සියයට 65 සිට සියයට 75 දක්වා පරාසයක පැවතුණි. හිගුරක්ගොඩ ගුවන් තොටුපල සංවර්ධනය සඳහා ලබා දුන් රු.බිලියන 2 ක ප්‍රතිපාදන වලින් වර්ෂය අවසානයේදී සියයට 75 ක් ඉතිරි කර තිබුණු අතර ,ඉලක්ක ගත සංවර්ධන කටයුතු සම්පූර්ණ කිරීමට අපොහොසත් වී තිබුණි.	ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශය 2024 වර්ෂයට අදාළ බිල්පත් නියමිත කාල සීමාවන්ට ලබා නොදුන් අතර වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය මඟින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනයට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට 2024.06.13 දින ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා අනුමැතිය 2024.07.02 දින ලැබී, ගුවන් හමුදාව විසින් මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු නොකඩවා සිදු කළද 2024.12.31 දින වන විටත් භෞතික ප්‍රගතිය සම්පූර්ණ කිරීමට හැකි වූයේ සියයට **34** ක් පමණක් බව.	වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන කාර්යක්ෂම ලෙස උපයෝජනය කර ඉලක්ක ගත සංවර්ධන කටයුතු කඩිනමින් සම්පූර්ණ කළ යුතු වීම.

3.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	වටිනා කම	අනුකූල නොවීම	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**				
	මුදල් රෙගුලාසි 104 (3) සහ 104 (4)	-	2003 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා අවස්ථා 215 කදී සිදුවී ඇති එකතුව රු. මිලියන 14.89 ක අලාභ හානි සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තා ඉදිරිපත් කිරීමට ක්‍රියාකර නොතිබුණු අතර , ගුවන් හමුදාවේ විවිධ වත්කම්වලට 1999 සිට 2024 දක්වා වර්ෂවල සිදුවූ අලාභ සිද්ධි 65 කට අදාලව එකතුව රු. බිලියන 2.18 ක අලාභ හානි සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තා ඉදිරිපත් කිරීමට මාස 01 සිට මාස 144 ක් දක්වා වූ කාලයක් ප්‍රමාද කර තිබුණි. තවද 2002 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා සිද්ධි 158 කට අදාලව රු.බිලියන 1.9 ක අලාභ හානි සම්බන්ධයෙන් පරිපූර්ණ වාර්තාද ඉදිරිපත් කර නොතිබුණි.	අලාභයක් සිදුව දින 7 ක් ඉක්ම යාමට ප්‍රථමව ප්‍රාරම්භක වාර්තා ඉදිරිපත් කිරීමටත්, මු.රෙ 104(4) යටතේ වන අවසාන වාර්තා අලාභය සිදුව මාස 03 ක කාලයක් ඇතුළත ඉදිරිපත් කිරීමටත් ගුවන් හමුදාව මඟින් හැකි සෑම උත්සාහයක්ම මේ වනවිටත් ගෙන ඇති බව.	නියමකර ඇති කාලය තුල මුදල් රෙගුලාසි ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තා හා පරිපූර්ණ වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වීම.
(ආ)	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය		ගුවන් හමුදාවට අයිත් කාර් 56 කද , වෑන් 22 කද ,කැබ් රථ 92 කද, ජීප් 112 කද , බස් 46 කද සහ ත්‍රීරෝද රථ 17 කද සහ කුලී පදනම මත ලබා ගෙන ඇති කාර් 359 කද , වෑන් 05 කද ,කැබ් රථ	තාවකාලිකව ධාවනයෙන් ඉවත්කර ඇති ,අපහරණ ක්‍රියාවලි වෙනුවෙන් ධාවනයෙන් ඉවත් කර ඇති සහ කුලී පදනම	ඉන්ධන දහන පරීක්ෂාව චක්‍රලේඛ විධි විධාන ප්‍රකාරව සිදුකළ යුතු වීම.

12 කද, සමාලෝචිත වර්ෂය තුළ ඉන්ධන දහනය වීම පරීක්ෂා කිරීමක් සිදුකර නොතිබුණි. ප්‍රවාහන අංශ විසින් තීරණය කළ ඉන්ධන දහනය වීම් ප්‍රමාණයන් හෝ එක් එක් ගමනේදී වැය වූ ඉන්ධන දහනය වීම් ප්‍රමාණයන් අනුව ධාවන සටහන් තුළනය කර තිබුණි.	මත ලබා ගෙන ඇති වාහන වල මෙම පරීක්ෂාව සිදු කර නොමැති බව.

3.6 අවිධිමත් ගණුදෙනු

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
අංක 6000-0-0-13-097 දරණ පොදු තැන්පත් ගිණුම මගින් ඉදිකිරීම් සඳහා වන තැන්පතු රඳවා ගන්නා අතර, එම තැන්පතු වලින් අවස්ථා 16 කදී රු. මිලියන 9.37 ක තැන්පතු ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ව්‍යවස්ථාපිත නොවන අරමුදල් වෙත ගෙවා තිබුණි.	ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ණය පදනම මත එම භාණ්ඩ හා සේවා සැපයීම සිදු නොකරන අවස්ථාවන්හිදී එම කාර්ය සිදු කරලීමේදී පවතින එකම විකල්පය ලෙස සුභ සාධක ගිණුම් හරහා නැවත පියවීමේ පදනම මත ප්‍රසම්පාදන සම්පූර්ණ කොට පසුව රජයේ මුදල් මඟින් අවකරණය සිදු කරනු ලබන බව.	තැන්පතු මුදල් ව්‍යවස්ථාපිත නොවන අරමුදල් වෙත නොගෙවිය යුතු වීම.

3.7 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
මියගිය,විශ්‍රාම ගිය,සේවය අතහැර ගොස් ඇති,ගුවන් හමුදා සහ සිවිල් නිලධාරීන්ගෙන් මෙතෙක් අයකර ගැනිමට අපොහොසත් වූ වර්ෂ 01 සිට 28 දක්වා කාල පරාසයකින් යුතු ගුවන් හමුදා සහ සිවිල් නිලධාරීන් 81 දෙනෙකුගෙන් එකතුව රු.5,108,666 ක ආපදා ,දේපළ, ගංවතුර,උත්සව හා විශේෂ අත්තිකාරම් ණය ශේෂ පැවතුණි. මෙම ණය ශේෂ තුළ, වර්ෂය ඉක්මවූ වර්ෂ 28 දක්වා කාල පරාසයක් තුළ සේවය හැර ගොස් ඇති සිවිල් නිලධාරීන් 59 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.4,790,536 ක ණය ශේෂ පැවතුනි. මෙම හිඟ හිටි ණය ශේෂ අයකර ගැනීමේ ක්‍රියාමාර්ග සතුටුදායක මට්ටමක නොපැවතුණි.	ඇතැම් ණය ශේෂ මේ වන විට අය වෙමින් පවතින අතර රු.100,000 ට වැඩි ණය ශේෂයන් සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව.	ආයතන සංග්‍රහයේ XXIV පරිච්ජේදයේ 4.3 වගන්තියේ දැක්වෙන විධිවිධාන අනුව සහ 2024 මැයි 29 දිනැති අංක 01/2024 දරණ රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයේ 04 (III) ජේදය ප්‍රකාරව කටයුතු කර මෙම ණය ශේෂ කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව රු. මිලියන 487.30 ක වියදමකින් සැලසුම් කළ කාර්යභාරයන් 61 ක් වර්ෂය අවසාන වන විටද ඉටුකර නොතිබුණි.	වර්ෂය තුළ ප්‍රසම්පාදන කටයුතු සිදු කර ගැනීමට නොහැකි වීමෙන් සහ ඇතැම් සේවා අත්හිටුවීමට සිදු වීමෙන් මෙම කාර්යයන් ඉටු කර ගැනීමට නොහැකි වූ බව.	ක්‍රියාකාරී සැලැස්ම ප්‍රධාන කළමණාකරණ උපාය මාර්ගයක් ලෙස සළකා, අපේක්ෂිත කාර්යසාධනය ළඟාකරගත යුතු වීම.

4.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව එකතුව රු.බිලියන 13.40 ක වියදමකින් සැළසුම් කළ කාර්යභාරයන් 157 ක වර්ෂය අවසානයට ඉටුකර තිබුණු ප්‍රගතියේ ප්‍රතිශතය සියයට 0.52 සිට සියයට 89 දක්වා පරාසයක් වී තිබුණි.	අතිකාල දීමනා සීමා කිරීම,කලට වේලාවට අක් මුදල් නොලැබීම, ව්‍යාපෘති අතර මැද නතර කිරීම,විනිමය අනුපාතයේ වෙනස් වීම, ප්‍රසම්පාදන කටයුතු වල ප්‍රමාදයන්, ආනයන සීමා පැනවීම සහ ඇතැම් සැලසුම් වෙනස් කිරීමට සිදු වීම වැනි හේතු නිසා අපේක්ෂා කළ ප්‍රගතිය ලබා ගැනීමට නොහැකි වූ බව.	ක්‍රියාකිරී සැලැස්ම ප්‍රධාන කළමණාකරණ උපාය මාර්ගයක් ලෙස සළකා, අපේක්ෂිත කාර්යසාධනය ළඟා කරගතයුතු වීම.

4.3 ප්‍රසම්පාදනයන්

සමාලෝචිත වර්ෂයේ විගණන නියැදි පරීක්ෂාවක් ලෙස එකතුව රු මිලියන 112.76 ක ප්‍රසම්පාදනයන් 06 ක් පරික්ෂා කිරීමේදී අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	එකතුව රුපියල් මිලියන 98.36 ක වියදමෙන් සිදුකල ප්‍රසම්පාදනයන් 05 කදී ජාත්‍යන්තර සීමිත තරඟකාරී ලංසු ක්‍රමය යටතේ සිදුකර ඇති බව සඳහන්කර ඇති අතර, 6.2.2 ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු කැඳවීමේ අවම කාලය දින 42 ක් ලබාදිය යුතු වුවත්, ලංසු කරුවන්ට දින 07 , දින 14 හා දින 21 දක්වා වූ කාලයක් පමණක් ලබා දී තිබුණි. තවද රු.මිලියන 14.41 ක වියදමින් අවස්ථා 11 කදී සෙවිලි තහඩු මිලදී ගැනීමේදී සීමිත ජාතික තරඟකාරී ලංසු ක්‍රමය යටතේ සිදුකර ඇති බව සඳහන්කර ඇති අතර 6.2.2 ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු කැඳවීමේ අවම කාලය දින 21 ක් ලබාදිය යුතු වුවත්, ලංසු කරුවන්ට ලබාදී තිබුණේ දින 07 ක් පමණි. මෙම තත්වය යථෝක්ත ප්‍රසම්පාදන මාර්ගෝපදේශය කඩ කිරීමක් මෙන්ම මිල තරඟය සීමාකිරීමට කටයුතු කිරීමක් ලෙස ද නිරීක්ෂණය කෙරේ.	අදාළ අයිතමයන් අවශ්‍ය වූ IOR සහ AOG (Aircraft On Ground) යන ප්‍රමුඛත්වය මත දින 07 ක සහ දින 14 ක කාලයක් ලංසු යොමු කිරීම සඳහා ලබා දී ඇති බව හා වර්තමානය වන විට ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුකූලව කටයුතු කරනු ලබන බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශය න් ප්‍රකාරව ලංසු කැඳවීමේදී ලබාදිය යුතු අවම කාළය ලබා දීමට කටයුතු කළයුතු වීම.
(ආ)	තාක්ෂණික ඇගයීම් කමිටු පත්කිරීම සඳහා දින 20 සිට දින 28 ක් දක්වා කාලයක් ප්‍රමාදකර ඇති අතර , එම කාලයෙන් ප්‍රසම්පාදන කටයුතු ද ප්‍රමාද වී තිබුණි. මෙම ප්‍රමාදයන් හේතුවෙන් 2.6.1 (අ) (i) , (ii), (iv) සහ 5.3.1 (ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් කඩකර තිබුණි.	තාක්ෂණික ඇගයීම් කමිටු පත් කිරීම මාණ්ඩලික ප්‍රධානි කාර්යාලය මඟින් සිදු කර ඇති අතර ප්‍රසම්පාදන නිරීක්ෂණ අංශය මඟින් පත් කරනු ලබන කමිටුව දැනුවත් කර ඉදිරි කටයුතු සිදු කරනු ලබන බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යන් ප්‍රකාරව කඩිනමින් තාක්ෂණික ඇගයීම් කමිටු පත්කිරීමට කටයුතු කළයුතු වීම.
(ඇ)	රු. මිලියන 19.41 ක් වැය කර Mess kit Shoes සහ රු.මිලියන 17.56 ක් වැයකර Braid Materials 197,700 ක් මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන සැලැස්මේ සහ ලංසු ලේඛනවල ජාත්‍යන්තර සීමිත ලංසු ක්‍රමය අනුගමනය කර ඇති බව සඳහන් කර තිබුණද, දේශීය ලංසු කරුවන්ගෙන්ද මිල ගණන් කැඳවා තිබුණු	තරඟකාරිත්වය වැඩි කිරීම සඳහා සියළුම සැපයුම්කරුවන්ගෙන් මිළ ගණන් කැඳවූ අතර,ඇතැම් පිරිවිතර අවශ්‍යතාවයට වඩා වැඩි නිසා එය ගුවන් හමුදාවට වාසිදායක බැවින්	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යන් ප්‍රකාරව කටයුතු කර ලංසු ඇගයීම ස්වාධීනව හා අපක්ෂපාතීව

	අතර, 3.3 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ සඳහන් නිර්ණායකයන් නොසලකා මිළ තරඟය සීමා කිරීමේ අරමුණින් මෙම මිලදී ගැනීම් ජාත්‍යන්තර/ ජාතික සීමිත පාලිත ලංසු ක්‍රමය යටතේ සිදුකර තිබුණි. Mess kit Shoes ප්‍රසම්පාදනයේදී පිරිවිතර විචලතාවයන් වැඩි සැපයුම්කරු නිර්දේශය කර මිලදී ගෙන තිබුණු අතර අඩුමිල සැපයුම්කරු නිර්දේශ කළ බව සඳහන් කර තිබුණද එම සැපයුම් කරුගේ රේගු සහ ප්‍රවාහන ගාස්තු සළකා බැලීමේදී මිල අධික සැපයුම්කරු බවට පත්වන බැවින් බැහැර කරන ලද සැපයුම්කරුගෙන් මිලදී ගත්තේනම් රු.මිලියන 3.81 ක් ඉතිරි කර ගැනීමට හැකිව තිබුණි.තවද Braid Materials මිලදී ගැනීමේදී අදාල පිරිවිතර සමඟ සැසඳෙන බවට වූ පරීක්ෂණ වාර්තාවක් නොතිබූ බැවින් අදාළ තොග නිසි ප්‍රමිතියෙන් හා ගුණත්වයෙන් ලැබුණේද යන්න මතභේදාත්මක වේ. 2024 නොවැම්බර් 13 දින ගබඩාවට ලැබී තිබුණු Mess kit shoes 650 න් රු. මිලියන 12.84 ක් වටිනා Mess kit shoes 632 ක් හෙවත් සියයට 97 ක් 2025 අප්‍රේල් 25 දින වන විටත් ගබඩාවේ ඉතිරිව පැවතුණි. තවද, 2024 ජූනි 20 දින ගබඩාවට ලැබී තිබුණු Braid Materials 197,700 ක ප්‍රමාණයෙන් රු. මිලියන 8.57 ක් වටිනා Braid Materials 139,418 ක් හෙවත් සියයට 70 ක් මාස 10 කට ආසන්න කාලයක් ගබඩාවේ නිකුත් නොවී නිශ්කාර්යව පැවතුණි.	තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශයන් මත මිළදී ගෙන ඇති බව සහ ගුවන් හමුදා මූලස්ථානය මඟින් පත් කරන ලද තත්ත්ව පරීක්ෂණ කමිටු මඟින් පිරිවිතර අවශ්‍යතාවයන් සලකා බලා තොගයට ගෙන ඇති බව සහ අදාළ තොග ප්‍රමාණය 2026 වර්ෂය වන විට නිකුත් කිරීමට නියමිතව ඇති බව.	සිදු කළ යුතු වීමත්, නියදියට අනුව මුළු තොගය පවතීද යන්න විධිමත්ව පරීක්ෂා කිරීමත්, අවශ්‍යතාවයන් නිසි පරිදි සලකා බලා ප්‍රසම්පාදනයන් සිදු කිරීමත් කළ යුතු වීම.
(ඈ)	රු.මිලියන 27.92 ක් වැයකර integrated valve and filter Assembly for rebuilding SUH 563 Bell 212 helicopter මිලදී ගැනීමේදී තාක්ෂණික ඇගයීම් කමිටුව පත් කිරීමට දින 23 ක් ද, ඔවුන්ගේ නිර්දේශ ලබාදීමට දින 71 ක් ද ප්‍රමාදවී තිබූ අතර, මෙම ප්‍රමාදය නිසා සැපයුම්කරුවන් විසින් එකඟ වූ මිලට අදාල සැපයුම ලබාදිය නොහැකිබව දන්වා තිබුණි. මේනිසා නැවත මිල ගණන් කැඳවා එම සැපයුම්කරුගෙන්ම යථෝක්ත සැපයුම ඇමරිකන් ඩොලර් 2,658 ක් හෙවත් රු. 815,670 ක් වැඩිපුර ගෙවා මිලදී ගැනීමට සිදුවී තිබුණි.	අදාළ ප්‍රසම්පාදන කටයුතු 2023 දෙසැම්බර් 20 දින සිට 2024 මාර්තු 22 දින දක්වා සිදු කර ඇති බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යේ 04 වන පරිච්ඡේදය ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු මනා ලෙස සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු වීම.
(ඉ)	රු.මිලියන 14.41 ක් වැය කර අවස්ථා 11 කදී සෙවිලි තහඩු දික් අඩි 18,250 ක් මිළ දී ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ	සැපයුම්කරුවන්ගේ ලේඛනය මත ජාත්‍යන්තර සීමිත ලංසු ක්‍රමය අනුගමනය කර සිදු කර	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව සහ

සංග්‍රහයේ 3.3 ඡේදයේ සඳහන් නිර්ණායකයන් නොසලකා හරිමින් මිළ තරඟය සීමා කිරීමේ අරමුණින් සීමිත පාලිත ජාතික ලංසු ක්‍රමය යටතේ සිදුකර තිබුණු අතර, විධිමත් තත්ත්ව පරීක්ෂණ වාර්තාවක් මඟින් සින්ක් ඇළුමිනියම් බවට හෝ තහඩුවල ඝණකම මි.මි 0.47 බවට තහවුරු කර නොගෙන තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් මිළදී ගැනීමට අනුමැතිය ලබා දී තිබුණි. 2023 දෙසැම්බර් 04 දින මිළට ගත් සෙවිලි තහඩු 2024 පෙබරවාරි 08 දින පරික්ෂා කර විට ගබඩාව තුළදීම මළ බැඳීමට ලක් වී තිබුණි.	මිළදී ගැනීම සිදු කර ඇති බව සහ සැපයුම්කරු විසින් වගකීම් කාලයට යටත්ව නැවත වරක් එම තහඩු ප්‍රමාණය සැපයීමට එකඟත්වය ප්‍රකාශ කර ඇතත්, අලුතින් සපයන තහඩු සඳහා වගකීම් කාලයක් ලබා දිය නොහැකි බවට සැපයුම්කරු දන්වා ඇති බව.	ප්‍රමිතිය පිළිබඳ විධිමත් පරීක්ෂාවකින් පසු මිලදී ගැනීම් කළයුතු වීම.

4.4 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දින වන විට ගුවන් හමුදාව විසින්, දිවයිනේ විවිධ ප්‍රදේශවල හෙක්ටයාර් 639.2 ක ඉඩම් හා ගොඩනැගිලි 07 ක් නීත්‍යානුකූල අයිතියකින් තොරව දීර්ඝ කාලයක සිට පරිහරණය කරමින් පවතින අතර, මෙම දේපළවල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමේ කටයුතු ඉතා මන්දගාමී ස්වභාවයක පැවතුණි. නීත්‍යානුකූල අයිතියක් නැතත් යථෝක්ත ඉඩම් වල ගුවන් හමුදාව විසින් වටිනාකම හෙළිදරව් නොවූ විවිධ ඉදිකිරීම් සිදුකර තිබුණි.	මෙම වත්කම් නීත්‍යානුකූලව අත්පත් කර ගැනීම්/ පවරා ගැනීම් කටයුතු මේ වන විටත් සිදු කරමින් පවතින බව හා එම කටයුතු අවසන් වීමෙන් පසු තක්සේරු කර ලේඛනගත කර ගැනීම සිදු කරනු ලබන බව.	නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීම කඩිනමින් කළ යුතු වීම.
(ආ)	රක්ෂණාවරණයක් නොමැතිව ගුවන් හමුදාවේ කාර් 04 ක්ද, වෑන් 43 ක්ද, කැබ් රථ 159 ක්ද ,බස්රථ 87 ක්ද, ජීප් 216 ක්ද , මෝටර් බයිසිකල් 396 ක්ද , ත්‍රීවීල් 48 ක්ද , ලොරි/ ට්‍රක් රථ 260 ක්ද , ඇම්බියුලන්ස් 16 ක්ද සමාලෝචිත වර්ෂයේ ධාවනයට යොදවා තිබුණි.	1955 ජුලි මස 08 වැනි දින නිකුත් කරන ලද අංක 10815 දරණ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශිත කරුණුවලට අනුව ත්‍රිවිධ හමුදා වාහන රක්ෂණය සහ ආදායම් බලපත්‍ර ලබා ගැනීම යන ක්‍රියාවලීන්ගෙන් නිදහස්කර ඇති බව.	මෝටර් රථ පනතේ විධිවිධාන ප්‍රකාරව අදාළ වාහන සඳහා රක්ෂණාවරණ යක් ලබා ගත යුතු වීම.
(ඇ)	ගුවන් හමුදාව විසින් ලියාපදිංචි නොකළ කාර් රථ 03 ක්ද , වෑන් 37 ක් ද , යතුරු පැදි 113 ක් ද,කැබ් රථ 57 ක්ද ,බස් රථ 44 ක් ද, ජීප් රථ 208 ක් ද, ත්‍රීරෝද රථ 04 ක් ද, ට්‍රක් රථ 103 ක් ද, ප්‍රයිම් මූවර් 06 ක් ද , ඩම්ප් ලෝටර් 04 ක් ද , ට්‍රැක්ටර් /අත් ට්‍රැක්ටර් 129 ක් ද , ඇම්බියුලන්ස් 30 ක්ද පරිහරණය කරමින් පැවතුණි.	ලියාපදිංචි නොකළ වාහන මිලදී ගෙන ඇති වර්ෂයේ ප්‍රමුඛතාවය මත වාහන ලියාපදිංචි කර ගැනීම සඳහා 2024 සැප්තැම්බර් මස 05 වන දින මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත ලිඛිතව ඉදිරිපත් කර ඇති බව.	අදාල වාහන කඩිනමින් ලියාපදිංචි කර ගත යුතු වීම.

(ඇ)	සමාලෝචිත වර්ෂය අවසාන වන විට ලියාපදිංචි නොකළ මෝටර් රථයක් හා ගුවන් හමුදාවට අයත් යතුරු පැදියක් නීත්‍යානුකූල පැවරීමකින් තොරව ආරක්ෂක අමාත්‍යාංශයට මුදාහැර තිබුණු අතර, නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමකින් තොරව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට අයත් ජල බවුසර 3 ක් හා ජපන් ලංකා මිත්‍රත්ව සංගමයට අයත් ගිලන් රථයක්ද ගුවන් හමුදාව විසින් පරිහරණය කරමින් පැවතුණි.	මෝටර් රථය හා යතුරු පැදිය ආරක්ෂක අමාත්‍යාංශය වෙත තාවකාලික රාජකාරී මත පදනම්ව ලබාදෙන අතර මෙම වාහනවල නඩත්තු සහ සේවා කටයුතු ගුවන් හමුදාව විසින් සිදු කරනු ලබන බව සහ ජල බවුසර 3 සහ ගිලන් රථය පවරාගැනීම සඳහා අවශ්‍ය ලියකියවිලි මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇති බව.	නීත්‍යානුකූලව පවරාගැනීම් හා නිදහස් කිරීම් කළයුතු වීම.
(ඉ)	කටුකුරුන්ද හමුදා කඳවුරු භූමිය අක්කර 85 රූඩ් 02 යි පර්චස් 21.62 ක් වුවද, 2015 වර්ෂයේදී එම භූමිය අක්කර 81 රූඩ් 03 පර්චස් 7.9 ලෙස අක්කර 03 රූ 0 යි පර්චස් 14.53 ක් අඩුවෙන් දක්වා තිබුණද මෙතෙක් එම තත්ත්වය නිරවුල්කර ගැනීමට අපොහොසත් වී තිබුණු අතර , ගුවන් යානා ධාවන පථය පුළුල් කිරීම සඳහා යොදාගනු ලැබූ ඉඩම් කැබලි 21 ක් අතුරින් හෙක්ටෙයාර 0.6521 ක ප්‍රමාණයක ඉඩම් කොටස් 02 ක් විගණිත දින වන විටත් පවරාගෙන නොතිබුණි. තවද 2001 වර්ෂයේදී කඳවුර වෙත පරිත්‍යාග ලෙස ලැබී ඇති අක්කර 01 පර්චස් 7.9 ක ඉඩම අනවසර පදිංචිකරුවන් තිදෙනෙකු අත්පත්කරගෙන ඇතත් , ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	ගුවන් හමුදා මිනින්දෝරු නිලධාරියෙක් පැමිණ කටුකුරුන්ද කඳවුරට අයත් ඉඩම සම්පූර්ණ මිණුමක් සිදු කරන ලද අතර එහිදී භූමි ප්‍රමාණයේ විෂමතාවයක් පවතින බව සහ හෙක්ටෙයාර 0.6521 ක ඉඩම් කොටස් දෙක ප්‍රාදේශීය ලේකම් කළුතර හා සම්බන්ධ වී අවශ්‍ය කටයුතු සිදු කර ගන්නා ලෙස දන්වා ඇති බව.	අදාළ ඉඩම් කඩිනමින් නිරවුල් කර ගත යුතු අතර අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීම සම්බන්ධයෙන් ද කටයුතු කළයුතු වීම.

4.5 පාඩු හා හානි

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
විගණන නියැදි පරීක්ෂණයකදී, අනාවරණය වූ පරිදි 2023 වර්ෂයේ සිදුව වී තිබූ එකතුව රු. මිලියන 52.39 ක් වූ අලාභ හානි සිද්ධි දෙකක් ,හානි හා පාඩු ලේඛනවල ඇතුළත්ව නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදීද මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද (ඇමුණුම ii) පොත් වලින් කපාහැරීම් පිළිබඳ ප්‍රකාශය මඟින් අලාභ හානි ලෙස හෙළිදරව් කරද නොතිබුණි.තවද රු.මිලියන 70.54 ක් වූ වසර 10ට වැඩි සිදිධි 15ක් ද, රු.මිලියන 88.86 ක් වූ වසර 5ත් 10ත් අතර වූ සිද්ධි	අතපසුවීමක් හේතුවෙන් ඇමුණුම ii යටතේ වන පොතෙන් කපා හැරීම හා අයකර ගැනීම් ප්‍රකාශයට ඇතුළත් වී නොමැති අතර එම සිදුවීම් ඊළඟ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට නියමිත බව සහ නිරීක්ෂණය කර ඇති අලාභ හානි අය කර ගැනීමට කටයුතු කරමින් පවතින බව.	අදාළ අලාභ හානි ලේඛන ගත කර මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය කළ යුතු වීම සහ අයකර ගැනීමේ හෝ කපා හැරීමේ කටයුතු කඩිනම් කළ යුතු වීම.

12ක් ද පැවති අතර මෙම සිද්ධි සම්බන්ධයෙන් අලාභය අයකර ගැනීමේ හෝ කපා හැරීමේ කටයුතු මන්දගාමී ස්වභාවයක පැවතුණි.

4.6 කළමනාකරණ දුර්වලතා

විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
නිළධාරින්ගේ පරිහරණය සඳහා සහ වෙනත් ප්‍රවාහන අවශ්‍යතා සඳහා මෝටර් කාර් රථ 359 ක් ද,ඩබල් කැබ් රථ 12 ක් ද, වෑන් රථ 05 ක් ද,මසකට රු.50,000 සිට රු.300,000 දක්වා පරාසයක් තුළ කුලී ගෙවීමේ පදනම මත බාහිර පාර්ශවයන්ගෙන් ලබා ගෙන තිබුණි. ගිවිසුම් ප්‍රකාරව මෙම වාහන මසකට උපරිම කිලෝ මීටර් 3000 ක් ඉහත මිළ ගණන් යටතේම ධාවනයේ යෙදවීමේ හැකියාව පැවතුණි. සමාලෝචිත වර්ෂය තුළ මෙම කුලී වාහන සඳහා එකතුව රු. මිලියන 574.5 ක මුදලක් වැය කර තිබුණු අතර එක් එක් මාසයේදී ,කිලෝ මීටර් 500 ට අඩුවෙන් ධාවනය කළ අවස්ථා 57 ක් ද, කිලෝ මීටර් 500 ත් 1000 ත් අතර ධාවනය කළ අවස්ථා 141 ක් ද, කිලෝ මීටර් 1000 ත් 2000 ත් අතර ධාවනය කළ අවස්ථා 1,206 ක් ද, කිලෝ මීටර් 2000 ත් 3000 ත් අතර ධාවනය කළ අවස්ථා 2,169 ක් ද පැවතුණි. කුලී වාහන ප්‍රමාණය අඩු කර ගිවිසුම් ගත උපරිම කිලෝ මීටර් ගණන උපයෝජනය කර රජයට වඩාත් ආර්ථික ප්‍රතිලාභ ලබා ගත හැකි වන පරිදි කටයුතු කළ හැකි වුවත්, ඒ පිළිබඳව අවධානය යොමු කර නොතිබුණි.	වාහන හිමි නිලධාරීන් සංඛ්‍යාව 146 ක් වන අතර, සේවා ස්ථානයන් සිට නිවාස දක්වා ඇති දුර ප්‍රමාණයන් වෙනස්වීම, ඉන්ධන අරපිරිමැස්මෙන් භාවිතා කරන හෙයින් නිලරථ පරිහරණය කරනු ලබන කිලෝ මීටර් ගණන අවම වීම සහ හැකි සෑමවිටම රැස්වීම් යනාදිය මාර්ගෝපගත ක්‍රමවේදයන් ඔස්සේ පැවැත්වීම නිසා ධාවනය කරන කිලෝ මීටර් ගණන අවම වී ඇති බව.	කුලී ගෙවීමේ පදනම මත වාහන ධාවනයට එක් කිරීමේදී ගාස්තු වැඩි නොවන උපරිම කිලෝමීටර් ප්‍රමාණය ධාවනය කරවීමට කටයුතු කළයුතු වීම.

5. මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේදී ගුවන් හමුදාව සඳහා කාර්ය මණ්ඩල පුහුණු කිරීමට රුපියල් මිලියන 300 ක ප්‍රතිපාදන වෙන්කර දී තිබුණු අතර, එයින් රුපියල් මිලියන 75 ක මුදලක් වර්ෂ අවසානයට ඉතිරි කර තිබුණි. පුහුණු සැලැස්මට අනුව වර්ෂය තුල දේශීය පාඨමාලා 182 ක් පැවැත්වීමට සැලසුම්කර තිබුණද 167 ක් පමණක් පවත්වා තිබුණි. විදේශීය පාඨමාලා 151 ක් පැවත්වීමට සැලසුම් කර තිබුණ නමුත් පුහුණු සැලැස්ම පාඨමාලා 47 කින් ඉක්මවා විදේශීය පාඨමාලා 198 ක් පවත්වා තිබුණි.	දේශීය පුහුණු සඳහා වෙන් කළ ප්‍රතිපාදන ඉතිරි වී නොතිබුණු බව.	වාර්ෂික පුහුණු සැලැස්මට අනුගතව පුහුණු පාඨමාලා සංවිධානය කළ යුතු වීම.